සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**නර්තනය - I**

**නම/විභාග අංකය : ............................................................................. කාලය : පැය 01 යි.**

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය .**

**1 කොටසෙහි 1-30 දක්වා සියලුම ප්‍රශ්න සදහාද 30-40 දක්වා ඔබ උගත් සම්ප්‍රදායට අයත් ප්‍රශ්න කොටසද තෝරාගෙන පිළිතුරු සපයන්න.**

**11 කොටසෙහි පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05 ක් සදහා පිළිතුරු සපයන්න.**

01 ''සූරිය කුල ඇති හිරු දෙවියන්ගේ .......'' මෙම කවිය ගායනා කරනු ලබන්නේ ............. නැටුමේ දීය.
1 සවරං 2 ගොයම් කැපුම 3 පතුරු 4 කළගෙඩි

02 චාමර නර්තනය රාජ සහා ලක්ෂණ ගන්නා නිසා නර්තනයේ දී .............කවි ද භාවිතා කරයි.
1 හටන් 2 ප්‍රශස්ති 3 සවරං 4 මෝල්ගස්

03 ලී මල්ලිය භාවිතා කරමින් සුවිශේෂී ගෙතීම් රටා මැවීම සිදු කරනු ලබන්නේ ............. නර්තනයේ දීය.
1 පින්නල් කෝලාට්ටම් 2 කෝලාට්ටම්
3 සුලකු 4 අරියවෙට්ටු

04 සතර අභිනයේ දී ............. වාචික අභිනයට අයත් වේ.
1 අංගචලන 2 රංගවස්ත්‍රාභරණ 3 සංවාද 4 මුහුණේ ඉරියව්

05 සිරුරේ උපාංග කොටසට අයත් වන්නේ ............. ඇති සියුම් ඉන්ද්‍රියයන්ය.
1 මුහුණේ 2 කදෙහි 3 දෑත්වල 4 දෙපාවල

06 "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්......"මෙය .............ගේ වාර්තාවකි.
1 ස්පිල්බර්ජන් 2 ඉබන් බතූතා 3 රොබට් නොක්ස් 4 වස්කෝ ද ගාමා

07 පරාක්‍රමබාහු රජු තම හමුදා සෙබළුනගේ ආස්වාදනය පිණිස රඟුම් ඉදිරිපත් කරවූ බව ..............දැක්වේ.
1 මහාවංශ යේ 2 දීප වංශ යේ 3 චූල වංශ යේ 4 ථූප වංශ යේ

08 බෞද්ධාගමික කටයුතු අවස්ථාවක දී වැඩි වශයෙන් යොදා ගනු ලබන්නේ ............. ය.
1 දවුල හා තම්මැට්ටම 2 දවුල හා ගැට බෙරය 3 හොරණෑව සහ දවුල 4 උඩැක්කිය සහ දවුල

09 අංග රචනයේ දී එළිය සහ අඳුර මගින් මුහුණේ ............. ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
1 වටකුරු 2 සිරස් 3 තිරස් 4 ත්‍රිමාණ

10 ශාන්ත දේව්සෝජ් නිෂ්පාදනය කරන ලද ............. නම් මුද්‍රා නාට්‍ය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍ය වේ.
1 රන්දද 2 සීතාභරණ 3 හිමකුමාරි 4 ශිවරංග

11 භරත නැටුම් උගන්වන ප්‍රධාන අධ්‍යාපන ආයතනය වන්නේ,
1 ශාන්ති නිකේතනය 2 ලලිත කලායතනය
3 අඩියාර්හී කලා ක්ෂේත්‍රය 3 කේරළකලා මණ්ඩලය

12 භරත නැටුම් සඳහා  වාදනය කරනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,

1 තබ්ලාව 2 එඩැක්ක 3 චෙන්ඩාව 4 මෘදංගය

13 පිළිවෙලින් පෝරණුවට දැමීම සහ ඉල්ලම් ගැරීම දක්නට ලැබෙන කර්මාන්ත වන්නේ,

1 මැටි හා පතල් ය 2 මැටි හා කෘෂි ය 3 කොහු හා තේ ය 4 පතල් හා මැටි ය

14 තුන් තිත තාල වාදනයේ දී භාවිතා වන ධ්වනි ගුණයන් වන්නේ,

1 තිත් සහ තෙයි 2 තිත් තිත් සහ තෙයි 3 තෙයි තෙයි සහ තිත් 4 තෙයි තෙයි සහ තෙයි

15 ගද්‍ය හා පද්‍ය ලක්ෂණ එකතුව නිර්මාණය වී ඇති ගායනා විශේෂයකි.

1 පැල් කවි 2 ටීකා සීපද 3 පාරු කවි 4 පතල් කවි

16 උඩරට සහ සබරගමු වන්නම් රචනා වීමේ අරමුණ වන්නේ,

1පූජාර්ථයයි 2 කළගුණ සැලකීමයි 3 සම්ප්‍රදායයි 4 විනෝදාස්වාදයයි

17 පහතරට වන්නම් රචනා කළ යුගය සහ ස්ථානය වන්නේ,

1 දඹදෙණි යුගයේ දෙවුන්දර දේවාලයේදී ය 2 ගම්පොල යුගයේ සමන් දේවාලයේදී ය

3 මහනුවර යුගයේ කවිකාර මඩුවේදී ය 4 කෝට්ටේ යුගයේ දෙවුන්දර දේවාලයේදී ය

18 කෝලම් මඩුවෙහි එන පේඩිවිදානේ නමින් හඳුන්වන චරිතය වන්නේ,

1 හෙන්චප්පු ය 2 මුදලි ය 3 අණබෙරකරු ය 4 ජසයා ය

19 සොකරි ගැමි නාටකයෙහි දක්නට ලැබෙන රංග උපකරණයකි.

1 අයිලය 2 වෙස්අත්ත 3 වංගෙඩිය 4 පිදේන්න

20 චිත්‍රසේන ඩයස් මහතා විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍යයකි.

1 තිත්ත බත 2 කරදිය 3 සත්පත්තිනි 4 ගුහ අපලය

- 21 සිට 23 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න
-

| තීරුව | 1 පේළිය | 2 පේළිය | 3 පේළිය |
|---|---|---|---|
| A | විදුර | ගෝපිනාත් | බෙරහඬ |
| B | ශාන්තිදේව් ඝෝෂ් | ක්‍රිෂ්ණාට්ටම් | කුච්චි පුඩි |
| C | රවීන්ද්‍රනාත් තාගෝර් | උදය ශංකර් | කුම්මි |

21 කථකලි නර්තන සම්ප්‍රදාය බිහිවීමට බලපෑ ගැමි නාටකයක් ඇතුලත් වන්නේ

1 A තීරුවෙහි 2 වන පේළියේ ය 2 B තීරුවෙහි 2 වන පේළියෙඅද් ය

3 C තීරුවෙහි 1 වන පේළියේ ය 4 B තීරුවෙහි 3 වන පේළියේ ය

22 හනික වරෙව් කොල්ලනේ ........යන නාට්‍ය ගීතය අයත්වන නාට්‍ය දක්වෙන්නේ

1 B තීරුවෙහි 2 වන පේළියේ ය 2 A තීරුවෙහි 1 වන පේළියේ ය

3 C තීරුවෙහි 2 වන පේළියේ ය 4 A තීරුවෙහි 3 වන පේළියේ ය

23 ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට දායක වූ භාරතීය පඬිවරයකු දක්වෙන්නේ

1 C තීරුවෙහි 1 වන පේළියේ ය 2 B තීරුවෙහි 1 වන පේළියේ ය

3 C තීරුවෙහි 2 වන පේළියේ ය 4 A තීරුවෙහි 2 වන පේළියේ ය

24 කථකලී නර්තනයේ ගීත ගායනා කරනු ලබන්නේ

1 හින්දි සහ දෙමළ බසිනි
2 සංස්කෘත හා මලයාලම් බසිනි
3 මලයාලම් හා හින්දි බසිනි
4 දෙමළ හා සංස්කෘත බසිනි


25 කරුණාව නමැති ස්ථායි භාවයෙන් මතුවන රසයයි

1 ශෘංගාර
2 අද්භූත
3 ශාන්ත
4 රෞද්‍ර


- **26 - 28 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු පහත දැක්වෙන පින්තූර ඇසුරෙන් තෝරන්න**



A



B



C



D

26 කරදියේ මුද්‍රා නාට්‍යයේ සිසී ගෙ හා මණ්නඩිරාල ගේ චරිත රඟ පෑ ශිල්පිනියගේ සහ ශිල්පියාගේ ඡායාරූප දැක්වෙන අක්ෂර වන්නේ පිළිවෙලින්,

1 C සහ B ය
2 D සහ B ය
3 D සහ C ය
4 C සහ A ය

27 උඩරට නර්තනය හා වාදනය සම්බන්ධයෙන් ජාත්‍යයන්තර කීර්තියට පත් ශිල්පියා /ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,

1 C ය
2 A ය
3 B ය
4 D ය

28 අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධ ආයතනවල ප්‍රධාන තනතුරු දැරූ ශිල්පියා හා ශිල්පිනිය වන්නේ,

1 B සහ D ය
2 A සහ C ය
3 C සහ A ය
4 A සහ D ය

29 "මේරුං විරාජිත සමං " යන නමස්කාරය අයත් වන ගායනා විශේෂය වන්නේ,

1 ආසාත්මක
2 අනාසාත්මක
3 තාලාත්මක
4 සමස්ථානික

30 කුඹී කථාව මුද්‍රා නාට්‍යයේ නර්තන නිර්මාණය කරන ලද්දේ,

1 වජිරා චිත්‍රසේන මහත්මිය විසිනි
2 චිත්‍රසේන ඩයස් මහතා විසිනි
3 අංජලිකා චිත්‍රසේන මහත්මිය විසිනි
4 රවිබන්දු විද්‍යාපති මහතා විසිනි

## 11 කොටස - - උඩරට නැටුම්

31 උඩරට නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස් කර ගැනීමට උපයෝගී වනුයේ,
1 පාසරඹ හා දොඹින පදය 2 පාසරඹ සහ ඉලංගම් සරඹය
3 පාසරඹ සහ ගොඩ සරඹය 4 දොඹින පද සහ ඉලංගම් සරඹය

32 කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ එන නාට්‍යමය අවස්ථා දෙකකි.
1 යක්කම් සහ අඹ විදමන 2 යක්කම් සහ ගබඩා කොල්ලය
3 ඇත් බන්ධනය සහ ගුරුගේ මාලාව 4 අසුර යක්කම සහ රාමා මැරීම

33 සිංහරාජ වන්නමට අයත් බෙර පදය දැක්වෙන වරණය තෝරන්න.
1 දොදොන්ත තකු දොං 2 දොං ජිංත ගත දොංත
3 දොංදොං ජිං ජිං ගජිගත 4 දෝං ජිං ජිං තකට දොංතක

34 "ගසමින් කගපතින් දෙපලුව අසුර සෙන්"මෙම කවිය අයත් වනුයේ,
1 තුරඟා වන්නමට ය 2 සැවුලා වන්නමට ය
3 සිංහරාජ වන්නමට ය 4 හනුමා වන්නමට ය

35 උඩරට නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙකි.
1 කේ එස් ප්‍රනාන්දු මහතා 2 විල්සන් ඔලබොඩුව මහතා
3 චිත්‍රසේන මහතා 4 අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා

36 දොං ජිංත ගත දොංත වට්ටම අයත් තාල රූපය තෝරන්න.
1 සුළු මහා දෙතිත 2 මැදුම් මහා දෙතිත 3 සුළු මැදුම් දෙතිත 4 මහා තනිතිත

37 ගැට බෙරයේ කොටස් දෙකක් වනුයේ,
1 වලයට සහ සුරත්තට්ටුව 2 කැපුම්හම සහ අඩබෑය
2 වෙනිවර සහ බෙර පුහුල 4 මණ්ඩම සහ සුරත්තට්ටුවය

38 උඩරට වෙස් නර්තනයට අයත් ආභරණ වනුයේ,
1 අවුල් හැරය සහ ශිඛාබන්ධනය 2 උල්උඩය සහ හැඩකැල්ල
3 කයිමෙත්ත සහ කාඟුල් කුට්ටම 4 උල්උඩය සහ දෙවොල් තොප්පිය

39 උඩරට බෙර වාදනයේ දී යොදා ගන්නා සතර බීජාක්ෂර වේ.
1 තත් , දිත්, තොං, නං 2 තත්, ජිත්, තකට, කුදට
3 තකට කුදට තකට කුදට 4 තත්, ජිත්, තොං, නං

40 "තාම් දොම්ති ගත දොම්කිට තඩතක තරිකිට" මෙම අඩව්ව නටනු ලබන්නේ,
1 වෛරොඩි වන්නමට ය 2 හනුමා වන්නමට ය
3 සැවුලා වන්නමට ය 4 සිංහරාජ වන්නමට ය

## 111 කොටස - පහතරට නැටුම්

31 පහතරට නර්තනයේ මූලික අංගහාර සකස් කර ගැනීමට උපයෝගී වන්නේ,
1 පාසරඹ සහ දොඹින පදය 2 පාසරඹ සහ ගොඩ සරඹය
3 පා සරඹ සහ ඉලංගම් සරඹය 4 ඉලංගම් සරඹ සහ දොඹින පදය

32 දෙවොල් මඩු ශාන්ති කර්මයේ එන නාට්‍යමය අවස්ථා දෙකකි.
1 අසුර යක්කම සහ රාමා මැරිම 2 දෙවොල් ගොඩ බැසීම සහ අඹ විදමන
3 අඹ විදමන සහ පොත් කඩේ පාලිය 4 දෙවොල් ගොඩ බැසීම සහ අසුර යක්කම

33 අනුරාග දණ්ඩ තාලයට අයත් බෙර පදය දැක්වෙන වරණය තෝරන්න.
1 තක දිත් තක දොං දොං දිං තක දොං 2 දොම් දොම් ගදිකි ට
3 ගුදිත ගුදම් ගත 4 දිත්තම් දිතකු දොම්

34 සඳ සන්දර නව මන්තර අදහාගත් ලෙසටා මෙම කවිය අයත් වනුයේ,
1 ශුද්ධ තාලයට ය 2 නාතිලිංචි තාලයට ය
3 අනුරාග දණ්ඩ තාලයට ය 4 ඊශ්වරකුණ්ඩ තාලයට ය

35 පහතරට නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙකි.
1 එස් පණීභාරත මහතා 2 අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා
3 ඩී වී පුංචිනිලමේ මහතා 4 විල්සන් ඔලබොඩුව මහතා

36 ගුද ගති ගත වට්ටමට අයත් තාල රූපය තෝරන්න.
1 මැදුම් තනිතිත 2 සුළු මැදුම් දෙි තිත 3 සුළු තනි තිත 4 මැදුම් මහ දෙතිත

37 පහතරට බෙරයෙහි කොටස් දෙකක් වනුයේ,
1 බෙර පුහුල සහ වෙනිවර 2 වෙනිවර සහ සුරත්තට්ටුව
3 හයිතට්ටුව සහ වෙනිවර 4 කැපුම්හම හා බෙරපුහුල

38 පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයට අයත් ආභරණ වනුයේ,
1 පබළු ඉන හැඩය, පබළු කරමාලය 2 පබළු තුල්ල, කාගුල් කුට්ටම
3 කාගුල් කුට්ටම, පබළු කරමාලය 4 රැලි සාය, කර මාලය

39 පහතරට බෙර වාදනයේ දී යොදා ගන්නා සතර බීජාක්ෂර වේ.
1 තත්, ජිත්, තොං, නං 2 තත්, දික්, ගුං, රිම්
3 තත් , තකට, ජිත්, තකට 4 තත්, දිත්, තොං, නං

40 තකදිත් තක දොං කිත්තත් කිටිතක යන ඉරට්ටිය නටනු ලබන්නේ,
1 හනුමන්තා තාලයටය 2 ඊශ්වරකුණ්ඩ තාලයට ය
3 ශුද්ධ තාලයට ය 4 අනුරාග දණ්ඩ තාලයට ය

## 1v කොටස - සබරගමු නැටුම්

31 සබරගමු නර්තන සම්ප්‍රදායේ මුලික අංගහාර සකස්කර ගැනිමට උපයෝගී වන්නේ,

1 පා සරඹ හා ඉලංගම් සරඹ 2 ඉලංගම් සරඹ හා දොඹින පද

3 මණ්ඩි පද සහ දොඹින පද 4 අත් සරඹ සහ දොඹින පද

32 පහන් මඩු ශාන්ති කර්මයේ එන නාට්‍යමය අවස්ථා දෙකකි .

1 යක්කම් සහ අඹ විදමන 2 අසුර යක්කම සහ පොත් කඩේ පාලිය

3 ආත් බන්ධනය සහ ගුරුගේ මාලාව 4 අසුර යක්කම සහ ගබඩා කොල්ලය

33 විරාඩි වන්නමට අයත් බෙරපදය දැක්වෙන වරණය තෝරන්න.

1 ජිමිත කුදා දොං 2 කුදක් තක්ක තකිට ජිමිතකු

3 ජිංත කුදක් තත් තකට 4 ජිංත ජිමිත්තක් තක්කිට තරිකිට

34 "හයියෙන් කිව්වොත් වන්නම ඔබිනට" මෙම කවිය අයත් වනුයේ ,

1 විරාඩි වන්නමට ය 2 මණ්ඩුක වන්නමට ය

3 කොවුලා වන්නමට ය 4 ආනන්ද වන්නමට ය

35 සබරගමුව නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙකි.

1 එස්.පණිභාරත මහතා 2 අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා

3 විල්සන් ඔලබොඩුව මහතා 4 ඩී.වී.පුංචි නිලමේ මහතා

36 ගමන් මාත්‍රය අයත් තාල රූපය තෝරන්න.

1 සුළු තනි තිත 2 සුළු මැදුම් දෙතිත 3 මැදුම් තනි තිත 4 මැදුම් මහා දෙතිත

37 දවුලෙහි කොටස් දෙකක් වන්නේ,

1 ගැටිය සහ හැක්මය 2 මණ්ඩම සහ තට්ටුවය

3 ගැටිය සහ තට්ටුවය 4 ගැටිය සහ පුරන්තට්ටුවය

38 සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් ආභරණ වනුයේ,

1 හැඩකැල්ල පබළු හැට්ටය 2 හැඩකැල්ල කාගුල

3 අත්පොට සතර කාගුල 4 කයිමෙත්ත කාගුල

39 දවුල් වාදනයෙහි යොදාගන්නා සතර බීජාක්ෂරවේ.

1 තත්, දිත්, තොං, නං 2 තත්, දිමි, තොං, ජිං

3 ජිං, තකට, ජිමි, තකට 4 තත්, ජිත්, තොං, තං

40 ගත්තකු දිත් තා දොංගඩ තරිකිට ජිත්තා යන අඩව්ව නටනු ලබනුයේ ,

1 ගමන් මාත්‍රයට ය 2 මණ්ඩුක වන්නමට ය 3 ශුද්ධ තාලයට ය 4 විරාඩි වන්නමටය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**නර්තනය - II**

**නම/විභාග අංකය : ..................................................................... කාලය : පැය 02 යි.**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් සඳහා පිළිතුරු සපයන්න.

(1) සියළු ප්‍රශ්නවලට සුදුසු පිළිතුර ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න

(i) "තුංතුඹගෙඩි තුනයි තුනයි" යන රබන් පදය .................... තනි තිතට වාදනය කළ හැකිය.

(ii) දළදා පෙරහැර අවසානයේ වස් දොස් දුරුවීම සඳහා ............................පවත්වනු ලබයි.

(iii) දෙපානෝ නමැති ගීත නාටකය .................... මහතාගේ නිර්මාණයකි.

(iv) නර්තනය අනිවාර්ය විෂයක් ලෙස පාසැල් විෂය මාලාවට ඇතුළත් කරන ලද්දේ ........ වර්ෂයේදී ය.

(v) කෝළම් රඟමඩල .................... නමින් හඳුන්වන් ලබයි.

(vi) නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා දායක වූ නර්තන ශිල්පිනියක් ලෙස.................... මහත්මියගේ දායකත්වය අගය කළ හැකිය.

(vii) ....................සෙල් ලිපිය අනුව දේවදාසීන් සිටි බවත් ඔවුන් දෙවියන් උදෙසා පූජා නැටුම් පැවැත්වූ බවත් සඳහන් වේ.

(viii) නන්දිකේශ්වරයන්ගේ .................... නමැති ග්‍රන්ථයෙහි ආරම්භයේදී ම ශිව දෙවියන්ට නමස්කාරයක් දක්වා ඇත.

(ix) කථකලී නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා .................... නමින් ද සහාය ගායකයා .................... නමින්ද හඳුන්වනු ලබයි.

(x) රිටිපන්න සහ සකපෝරුව යොදා ගනු ලබන්නේ කුමන කර්මාන්ත සඳහා ද?

(අ) රිටිපන්න.................. (ආ) සකපෝරුව.......................

(2) (i) පහත සඳහන් බෙරපද අතරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අදාල බෙර පදය තෝරාගෙන නියමිත තිත් රූපය අනුව ප්‍රස්ථාර කරන්න.

- දොං ජිංත ගත දොංත
- ගුං දෙගත ගත්ත ගුම්
- ජිං ජිමිත් තත් තකට

(ii) "ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට - මුහුණ පුරා තෙල් ගාගෙන යන කලට" යන කවි පද දෙක මාත්‍රා තුනේ ( 3+3) තනි තිතට ප්‍රස්ථාර කරන්න.

(iii) සිංහරාජ වන්නම හෝ විරාඩි වන්නමට අයත් අඩව්වක් හෝ අනුරාග දණ්ඩ තාලයේ ඉරට්ටිය ප්‍රස්ථාර කරන්න.

(3) පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(i) සතර අභිනය
(ii) පංචතූර්ය වාදන භාණ්ඩ වර්ගීකරණය
(iii) අංග රචනය
(iv) සිංදු වන්නම්
(v) දේශීය නාට්‍ය වර්ග

(4) දේශීය සංස්කෘතික අනන්‍යතාවය පිළිබිඹු කරන කැඩපතක් ලෙස ශාන්තිකර්ම දැක්විය හැකිය.

(i) පහන් මඩු ශාන්ති කර්මයේ එන චාරිත්‍ර විධි හතරක් නම් කරන්න.
(ii) දෙවොල් මඩු ශාන්ති කර්මයේ ඇතුලත් නර්තන අංගයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.
(iii) කොහොඹකංකාරි ශාන්ති කර්මයේ සැරසිලි හා රංග කාණ්ඩ පිළිබඳ විස්තරයක් කරන්න.

(5) සොකරි හා කෝලම් ගැමි නාටක තුළින් ජන ජීවිතය විදහා දැක්වේ.

(i) සොකරි නාටකයට අදාළ කවියක් ලියා දක්වන්න.
(ii) සොකරි නාටකයට අයත් චරිත දෙකක් පිළිබඳව හැඳින්වීමක් කරන්න.
(iii) ගැමි කලාකරුවා සමාජය විවරණය කරයි කෝලම් නාටකය ඇසුරින් මෙම පාඨය පැහැදිළි කරන්න.

(6) පහත දැක්වෙන රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

(i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර එම සම්ප්‍රදායට අයත් නර්තන අංග තුනක් නම් කරන්න.
(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය කුමක්ද? එහි වේෂ නිරූපණය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
(iii) C රූපයේ දැක්වෙන නාට්‍ය නම් කර එම නාට්‍යයෙහි කලාත්මක ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා යොදාගත් ක්‍රමවේද පැහැදිළි කරන්න.

(7) ජන මාධ්‍ය අතර රූපවාහිනිය ප්‍රබල මාධ්‍යයක් ලෙස දැක්විය හැකිය.

(i) රූපවාහිනී නාලිකාවල විකාශය වන නර්තන වැඩ සටහන් 4 ක් නම් කරන්න.
(ii) එම වැඩ සටහන් පාසැල් දරුවන්ගේ නර්තන කුසලතා වර්ධනයට ඉවහල්වේ ද? කෙටියෙන් අදහස් දක්වන්න.
(iii) රූපවාහිනී වැඩ සටහන්වල නර්තන අංග විචිත්‍රවත්ව ඉදිරිපත් කිරීමට යොදා ගත් උපක්‍රම දෙකක් පිළිබඳව විස්තර කරන්න.

## 11 ශ්‍රේණිය පළමු වාරය නර්තනය 1 පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01 - 3 | 11 -3 | 21 - 2 | 31 - 3 |
| 02 - 2 | 12 - 4 | 22 - 4 | 32 - 2 |
| 03 - 1 | 13 - 1 | 23 - 1 | 33 - 1 |
| 04 - 3 | 14 - 2 | 24 - 2 | 34 - 2 |
| 05 - 1 | 15 - 2 | 25 - 3 | 35 - 4 |
| 06 - 1 | 16 - 4 | 26 - 2 | 36 - 3 |
| 07 - 3 | 17 - 1 | 27 - 1 | 37 - 3 |
| 08 - 1 | 18 - 4 | 28 - 2 | 38 - 1 |
| 09 - 4 | 19 - 3 | 29 - 2 | 39 - 4 |
| 10 - 2 | 20 - 2 | 30 - 3 | 40 - 4 |

(01) (i) මැදුම්
(ii) වලියක් මංගල්‍යය
(iii) මකුලොළුව
(iv) 1972
(v) තානායම්පොළ
(vi) මිරන්ඩා හේමලතා
(vii) පාලමොට්ටායි
(viii) අභිනය දර්පනය
(ix) (අ) පොනානි
(ආ) සිංකිඩි/සිංගිඩි
(x) (අ) ධීවර කර්මාන්තය
(ආ) මැටි කර්මාන්තය

(2) (i) විභාග කර දක්වීම සහ සංකේත සඳහා - ලකුණු 02
බෙරපදය ප්‍රස්ථාර කිරීමට - ලකුණු 02

(ii) විභාග කර දක්වීම සහ සංකේත සඳහා - ලකුණු 02
කවි පාද දෙක ප්‍රස්ථාර කිරීමට - ලකුණු 02

(iii) විභාග කර දක්වීම සහ සංකේත සඳහා - ලකුණු 02
ඉරට්ටිය/අඩව්ව ප්‍රස්ථාර කිරීමට - ලකුණු 02 මුළු ලකුණු 12

(3) මාතෘකා තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියා තිබේ නම් ලකුණු 4 x 3 මුළු ලකුණු 12

(4) (i) පහන් මඩුවේ සිදු කරන චාරිත්‍ර විධි 4 ක් නම් කර තිබේ නම් - ලකුණු 04

(ii) දෙවොල්මඩු ශාන්ති කර්මයේ නර්තන විස්තර කිරීමට -ලකුණු 04

(iii) කොහොඹ කංකාරියේ සැරසිලි හා රංග උපකරණ පිළිබඳව කෙටියෙන් දක්වා තිබේ නම් ලකුණු 04

මුළු ලකුණු 12

(5) (i) සොකරි නාටකයට අදාල කවියක් ලියා තිබේ නම් - ලකුණු 04

(ii) සොකරි නාටකයට අදාළ චරිත 2 හැඳින්වීමට ලකුණු 2x2 - ලකුණු 04

(iii) කෝලම් නාටකයෙන් උදාහරණ දෙමින් සමාජ විවරණ කර තිබේ නම් - ලකුණු 04 මුළු ලකුණු 12

(6) (i) A රූපයේ දක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කිරීම -ලකුණු 01

නර්තන අංග 3 නම් කිරීමට -ලකුණු 03 මුළු ලකුණු 04

(ii) B රූපයේ දක්වෙන නර්තන සම්ප්‍රදාය ලියා තිබේ නම් -ලකුණු 01

වේෂ නිරූපණය පිළිබඳ විස්තර කිරීමට -ලකුණු 03 මුළු ලකුණු 04

(iii) C රූපයේ දක්වෙන නාට්‍ය නම් කිරීමට -ලකුණු 01

කලාත්මක ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා තාක්ෂණය යොදා ගත් ආකාරය සංගීතය පසුතල නිර්මාණ , රංගවස්ත්‍ර නිර්මාණය ආදී නිර්ණායකයන්ගෙන් 2ක් පැහැදිළි කර තිබේ නම් -ලකුණු 03

මුළු ලකුණු 12

(7) (i) රූපවාහිනී නාලිකාවල විකාශය වන වැඩ සටහන් 4ක් නම් කිරීම -ලකුණු 02

(ii) විචාරශීලීව අදහස් ඉදිරිපත් කර තිබේ නම් -ලකුණු 04

(iii) තාක්ෂණය යොදා ගැනීම, රංග වස්ත්‍රාභරණ ,සංගීතය ආදී අංග පිළිබඳව කෙටියෙන් සඳහන් කර තිබේ නම්

ලකුණු 06

මුළු ලකුණු 12


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


LOL.lk


අමතන්න - 071 777 4440/0756999990/071 8540371




































Online shopping

**www.lol.lk**
**Learn Ordinary Level**

DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










මිට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඔඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

